# 9 වසර දරු දැරියන් සඳහා

## 8 වන පාඩම - 67 පිටුව

### මහධන සිටුපුත්‍රගේ වස්තුව

i. මහ ධන සිටුපුත්‍රගේ වස්තුව ඇතුළත් වූ ග්‍රන්ථය කුමක්ද?
පිළිතුර: සද්ධර්ම රත්නාවලිය

ii. සද්ධර්ම රත්නාවලිය රචනා කළේ කවුද?
පිළිතුර: ධර්මසේන හිමියන්.

iii. සද්ධර්ම රත්නාවලිය රචනා වූයේ කිනම් යුගයේදීද?
පිළිතුර: දඹදෙණි යුගයේදීය.

**කතාව ගෙන හැර දැක්වීමට හේතුව:** යහපත් දේ නිසියදි නොකළමනා දෙය කරන්නවුන්ට සිදු වන විපාක දැක්වීමට.

**කථා සාරාංශය:**

බරණැස් නුවර අසූ කෝටියක් වස්තුව ඇති සිටු පවුලක සිටු පුත්‍රයෙක් ඉපදුනේය. සිටු පුතාගේ දෙමාපියෝ ඔවුන්ට විශාල සම්පත් ප්‍රමාණයක් ඇති නිසා පුතාට කිසිදු ශිල්පයක් ඉගැන්වූයේ නැත. ඉගැන්වූ එකම දෙය වූයේ ගී හා නැටුම් පමණකි. එම නුවරම අසූ කෝටියක් ධනය ඇති තවත් සිටු පවුලක දියණියක් උපන්නාය. ඇයගේ දෙමාපියෝද ඇයට ඇති තරම වස්තුව ඇති නිසා ගී නැටුම් පමණක් ඉගැන්වූහ. කල් යාමේදී එම සිටු පුතා අනෙක් සිටු පවුලේ දියණිය හා විවාහ වූයේය. පවුල් දෙකේම දෙමව්පියන් මිය ගිය විට එක් ලක්ෂ හැට කෝටියක ධනයක් ඔවුන්ට හිමි විය.

මෙම සිටු පුත්‍රයා දවසට දහස් වරක් රාජ සේවයට යන්නේය. අතර මිත්‍ර රා බීමට ලොල් වූ (ආශා වූ) පුද්ගලයන් මෙම සිටු පුත්‍රයාට රා බීමට ඇබ්බැහි කරවයි. ඒ සිටු පුත්‍රයා තම අසූ කෝටියක් වූ ධනය වැය කර රා බොයි. තම ධනය අවසන් වූ විට තම සිටු දියණියගේ (බිරිඳගේ) 80 කෝටියක් ධනය ද වැය කර රා බොයි. රා බීමට මුදල් නැති වූ විට සිටු මැදුරේ ඇති සියලුම භාණ්ඩ විකුණා රා බිවු අතර අවසානයේ සිටු මැදුර ද විකුණා රා බිව්වේය. සියලු ම දේපල අහිමි වූ සිටු පුත්‍රයා ; ඔහුගේ සිටු බිරිඳ ද කැටුව අනුන්ගේ පිළිකන්නුවල වාසය කරමින් සිගා කන්න වූහ.

එක් දවසක් භික්ෂූන් වහන්සේලා වළඳා අවසානයේ පාත්‍රවලින් ඒ බිමට හෙළනා බත්, සිටු පුත්‍රයා හා ඔහුගේ බිරිඳ අනුභව කරනවා දැක බුදුන් වහන්සේ සිනා වූ සේක. ඔහු (සිටු පුත්) තම ධනය නිසි ලෙස පාවිච්චි කළේ නම් ඔහු තරුණ වියේදී ද මධ්‍යම වයසේදී ද ලබා ගත හැකි ලෞකික හා ලෝකෝත්තර සැප සම්පත් පිළිබඳව දේශනා කරමින් කෙනෙක් තම වයසේදී ම (ළමා විය, මැදි විය හා මහලු විය) කළ යුතු දේ නොකර නොකළ යුතු දේවල් කළ විට විඳින ලද ඵල අහුලන්න කෙනෙකු නැති වූ විට දිරනවා වාගේ විනාශ වී යන බව දේශනා කළහ. දේශනාව අවසානයේ බොහෝ දෙනා සෝවාන්, සකෘදාගාමී, අනාගාමී හා රහත් ඵලවලට පැමිණියහ.

* දරුවනේ; ඔබ මෙය කියවා ඉන් පසු පෙළ හොඳට ඇති පාඩම කියවන්න. ඔබට නොතේරෙන වචනවල අර්ථ මා ලියා ඇත. ඉන් පසු 72 පිටුවේ ඇති අභ්‍යාසය කරන්න

අමාරු වචනවල අර්ථ

| වචනය | අර්ථය |
|---|---|
| 1. සෙස්ස හැසි දුසි | අනෙක් දේ, කුමෙකද |
| 2. විද්දස් කුලය | හී, හැඩුම් දන්නා කුලය |
| 3. හිල කළහ. | සියම කළහ. |
| 4. කෙළක් | කෝටියක් |
| 5. රා සොඬහු | රා බීමට ලොල් වූවන් |
| 6. එකුරුස්සේ | එකොළොස්කුවේ |
| 7. මුල පලා | රාබු |
| 8 ඩැ ඩැ | අල්ලා ගනිමින් |
| 9. කුලුන් | බමුන් |
| 10. පිය යුත්තෙක් | බීමට සුදුසු දෙයක් |
| 11. ධූර්තයෝ | මස් අන් ලොල්හු |
| 12. සුවඳ සන්දු | සුවඳ සඳුන් |
| 13. දු කෙළිය | දාදු ක්‍රීඩාව ( සූදු කෙළිය ) |
| 14. අසත් පිය | අරද මාතිය |
| 15. කළාල් | ඇතිරිලි |
| 16. මාවුලා | මෙට්ට |
| 17. බිසක්කන | පිළිකන්න |
| 18. කබල් කෙට් | වලං කැබලි |
| 19. නිකෘෂ්ට | පහත් |
| 20. නොමිලේ ලබා ගන්නවුන් | අයකැමැත්තක් නැතිව ලබා ගන්නවා |
| 21. කෘෂි වණික් | ගොවිතැන් හා වෙළඳාම් |
| 22 සෙද ගැමි | සකොදා ගාමි |
| 23. පුමිහ. | බිම |
| 24. අත් බැව් | ආත්ම භාවය |
| 25. පියාපත් වදළ කොස්වා ලිහිණියන් | පියාපත් හලනා ලද කොස්වා ලිහිණියන් |

මයුරි නානායක්කාර
දරුදැරිය.